ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම **2018/2019**

අවසාන පරීක්ෂණය - **2019**

විෂයමාලා න්‍යාය හා පරිචය - **ESU3129/STU5329**

කාලය පැය තුනයි. **(03)**

---

දිනය - **2019.02.14** වේලාව - පෙ.ව.**09.30** - ප.ව.**12.30** දක්වා

---

**1 වන කොටසේ සියලු ම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**1 වන කොටස**

01. විෂයමාලාව පිළිබඳව නිර්වචනයක් දක්වා එය පැහැදිලි කරන්න.

02. විෂයමාලාව සැලසුම් කරන ක්‍රියාවලියේ දී සලකා බලන මූලිකාංග නම් කරන්න.

03. නාට්‍ය හා රංගකලා විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ දී පාසලේ විෂය සමගාමී කටයුතුවලින් ලබාගත හැකි දායකත්වය විමසන්න.

04. විලර්ගේ විෂයමාලා ආකෘතිය විස්තර කරන්න.

05. පාසල් විෂයමාලාව සකස් කිරීමේ දී මනෝවිද්‍යාත්මක අදහස් වැදගත් වන්නේ ඇයිදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ශ්‍රී ලංකාවේ පන්සල් පාසලේ විෂයමාලාව කෙටියෙන් පැහැදිලි කරන්න.

07. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා වැඩලෝකය සම්බන්ධ කිරීමට ප්‍රයත්න දරණ ලද විෂයමාලා ප්‍රතිසංස්කරණයක් නම් කර ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග දක්වන්න.

08. විෂයමාලා සැලසුම්කරණයේ අවස්ථා පහක් **(05)** කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) පාසලේ විධිමත් විෂයමාලාව යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 04)

(ii) විධිමත් විෂයමාලාව සකස් කිරීමේ දි සැලකිල්ලට ගත යුතු කරුණු තුනක් (03) උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) නාට්‍ය හා රංගකලා ගුරුවරයෙකු ලෙස නාට්‍ය හා රංගකලා විෂය ඉගැන්වීමේ දි මුහුණ දෙන බාධක හා ඒවා මඟහරවා ගත හැකි ආකාරය විස්තර කරන්න.

(ලකුණු 08)

10. (i) විෂයමාලාව යාවත්කාලීන කිරීමේ දි මූලික වශයෙන් තොරතුරු ලබාගත හැකි ක්ෂේත්‍ර හතරක් **(04)** නම් කරන්න. (ලකුණු 04)

(ii) ද්විතියික පාසල් මට්ටමේදී ක්‍රියාත්මක කරනු ලබන විෂයමාලාවට සුදුසු පරමාර්ථ හතරක් **(04)** ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

(iii) නාට්‍ය හා රංකකලාව විෂය අන්තර්ගතයට සුදුසු කාලීන තේමා යෝජනා කරමින් සාධාරණීකරණය කරන්න. (ලකුණු 08)

11. (i) විෂයමාලා සංවර්ධන මූලධර්ම හතරක් **(04)** නම් කරන්න. (ලකුණු 04)

(ii) එකී සංවර්ධන මූලධර්ම නාට්‍ය හා රංගකලා විෂයයට අදාල කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) එකී මූලධර්ම ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංගකලා විෂයයන්හි ද්විතියික මට්ටමේ දී සලකා තිබේදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 08)

12. (i) විෂයමාලා සංවර්ධන ආකෘති තුනක් **(03)** නම් කරන්න. (ලකුණු 04)

(ii) ඉන් එක ආකෘතියක් රූප සටහනක් ඇසුරින් ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

(iii) ඔබ ඉදිරිපත් කළ ආකෘතියේ දුර්වලතා සඳහන් කර, ඒවා අවම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

13. (i) දර්ශනය සහ විෂයමාලාව අතර ඇති සම්බන්ධය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(ii) නාට්‍ය හා රංගකලාව විෂයමාලාව සකස් කර ගැනීමේ දී පදනම් කරගත හැකි දාර්ශනිකයන් දෙදෙනෙකුගේ අදහස් ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංගකලාව විෂයමාලාව තුළ එම දාර්ශනික අදහස් කොතෙක් දුරට ඇතුළත් වී තිබේදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 08)

14. (i) විෂයමාලා ඇගයීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) විෂයමාලා ඇගයීමේ ආකෘති නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) තෝරාගත් විෂයමාලා ආකෘතියට අනුව නාට්‍ය හා රංග කලා විෂයමාලාව පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.